අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/1/21/6/4
ඔබේ යොමුව / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2019.01. 22

චක්‍රලේඛ අංක 02/2019

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
විදුහල්පතිවරුන් වෙත,

## පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන

මේ සම්බන්ධයෙන් මෙයට පෙර නිකුත් කර ඇති 2007/21 අංක දරණ 2007.10.08 දිනැති චක්‍රලේඛය අභිබවා මෙම චක්‍රලේඛය මින් ඉදිරියට වලංගු වේ.

පුද්ගලයෙකුගේ පූර්ණ සෞඛ්‍යය අංශ කිහිපයක් ඔස්සේ රඳා පවතින අතර කායික,මානසික, සමාජයීය හා අධ්‍යාත්මික සෞඛ්‍ය වශයෙන් ඒවා වර්ග කළ හැකිය. සෞඛ්‍ය සම්පන්න දරුවකු සමාජයට යොමු කිරීම සඳහා මේ අංශ සියල්ල කෙරෙහිම එකම ආකාරයකට අවධානය යොමු කළ යුතු වේ. එම කාර්යය සඳහා ආරම්භයක් ලබා දිය හැකි ස්ථානය පාසලයි.

පාසල් පරිශ්‍රය සිසුන්ගේ පූර්ණ සෞඛ්‍ය වර්ධනය වන ආකාරයේ ප්‍රවර්ධන ස්ථානයක් බවට පත් කිරීම සඳහා පාසල් ප්‍රජාවගේ සම්පූර්ණ අවධානය යොමු කරමින් පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම මෙම වැඩසටහනේ ප්‍රමුඛ අරමුණ වේ. ඒ අනුව පාසල් සිසුන්,ගුරුවරුන්, දෙමාපියන් සහ පාසලට සුභපතන්නන්ගේ සහයෝගය ලබා ගනිමින් පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම විදුහල්පතිගේ වගකීම වේ.

2.0 ඉහත ප්‍රධාන අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා පහත අරමුණු අනිවාර්යයෙන්ම පාසල විසින් ඉටුකළ යුතුය.

- 2.1 සෞඛ්‍ය ප්‍රවර්ධන ප්‍රතිපත්ති සැකසීම.
- 2.2 පාසල් සිසුන් තුළ සෞඛ්‍ය ප්‍රවර්ධන දැනුම හා නිපුණතා ඇති කිරීම.
- 2.3 පාසල තුළ සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා හිතකර පරිසරයක් ඇති කිරීම.
- 2.4 පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා පාසල් සිසුන් ගුරුවරුන් ඇතුලු පාසල් ප්‍රජාවගේ සහභාගීත්වය ලබා ගැනීම.
- 2.5 සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහය ඇතිව පවත්වන පාසල් සෞඛ්‍ය සේවා, සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා ඵලදායි ලෙස යොදා ගැනීම.

3.0 පාසල තුළ කායික හා මානසික යහපැවැත්ම ප්‍රවර්ධනය සඳහා කටයුතු කිරීමේදී අවධානය යොමු කළයුතු මූලිකාංග

- 3.1හිංසනය, අපයෝජනය, හිංසාකාරී දඬුවම් හා ප්‍රචණ්ඩත්වයෙන් තොර ළමා හිතකාමී පරිසරයක් පැවතීම.
- 3.2 පාසල් පරිශ්‍රය අලංකාරව, ආරක්ෂිතව සහ ප්‍රියමනාපව පවත්වා ගැනීම.
- 3.3 වැසිකිළි හා කැසිකිළි ප්‍රමාණවත්ව හා පවිත්‍රව පවත්වා ගැනිම.
- 3.4 පානීය ජල පහසුකම් පැවතීම.
- 3.5 ශිෂ්‍ය සෞඛ්‍ය තත්ත්වය සහ පෝෂණ තත්ත්වය තක්සේරු කර අවශ්‍ය මැදිහත්වීම් සිදු කිරීම.

3.6 පාසල් සිසුන්ට හිතකාමී මනෝ සමාජයීය වාතාවරණයක් ඇති කිරීම.

3.7 සෑම සිසුවෙකුටම පාසල තුළ සම අවස්ථා හා ඉඩප්‍රස්ථා පැවතීම.

3.8 සෑම දරුවෙකුටම පාසලට ඒමට ඇති අයිතිය තහවුරු කිරීම.

## 4.0 වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා නියාමනය

මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී පාසල් හා ඊට අදාළ අනෙකුත් ආයතන තුළ වඩාත් සාර්ථකව මෙහෙයවීම සඳහා දැනටමත් පාසල්, කලාප හා පළාත් මට්ටමින් පිහිටුවා ඇති පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන ශිෂ්‍ය සමාජ හා සෞඛ්‍ය ප්‍රවර්ධන උපදේශක කමිටු පහත පරිදි සංශෝධනය කර ක්‍රියාත්මක කළ යුතුය.

### 4.1 පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන ශිෂ්‍ය සමාජ

පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන ක්‍රියාකාරකම් තීරණය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා සෞඛ්‍ය ප්‍රවර්ධන ශිෂ්‍ය සමාජ පිහිටුවිය යුතුය.මෙහිදී ප්‍රාථමික හා ද්විතියික අංශ සඳහා වෙන් වෙන් වශයෙන් සෞඛ්‍ය ප්‍රවර්ධන ශිෂ්‍ය සමාජ පිහිටුවීම යෝග්‍ය වේ. පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන ශිෂ්‍ය සමාජවල සියලු නිලතල හා වගකීම් සිසුන්ට ලබා දිය යුතුය.

#### 4.1.1 සංයුතිය

සභාපති,සම ලේකම්වරු,භාණ්ඩාගාරික, කාරක සභාව පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන ශිෂ්‍ය සමාජයේ සංයුතිය වන අතර මෙම නිලතල සියලු ම සිසුන් සඳහා විවෘත වේ.

#### 4.1.2 වගකීම

- පාසලේ ගැටලු හඳුනාගෙන සෞඛ්‍ය ප්‍රවර්ධන ප්‍රතිපත්තියක් සකස් කිරීම.
- පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධනය සම්බන්ධයෙන් වාර්ෂික සැලැස්මක් සකස් කර පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන උපදේශන කමිටුවේ අනුමැතිය ලබාගෙන ක්‍රියාත්මක කිරීම.
- මාසිකව රැස්වීම් පවත්වා අදාළ ක්‍රියාකාරකම්හි ප්‍රගතිය සමාලෝචනය හා සැලැස්ම ක්‍රියාත්මක කිරීම හා නියාමනය කිරීම.
- සෞඛ්‍ය ප්‍රවර්ධන ඇගයීම් නිර්ණායකවලට අනුකූලවන පරිදි අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම
- පාසල් සෞඛ්‍ය දිනයක් පැවැත්වීම.

### 4.2 පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන උපදේශක කමිටුව

#### 4.2.1 සංයුතිය-

විදුහල්පති (සභාපති)

සෞඛ්‍ය වැඩසටහන් භාර නියෝජ්‍ය විදුහල්පති/අංශ ප්‍රධාන/අදාළ ගුරු භවතුන්

ප්‍රාථමික අංශය භාර නියෝජ්‍ය විදුහල්පති/අංශ ප්‍රධාන

ගුරුවරු උපරිම 03 දෙනෙකු(ශිෂ්‍ය සංඛ්‍යාව මත පත් කිරීමට විදුහල්පතිට අවකාශ ඇත.)මේ සඳහා සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන/උපදේශන /ජීවන නිපුණතා/විද්‍යා හෝ වෙනත් ගුරුවරුන් යොදාගත හැකිය.

ශිෂ්‍ය නියෝජිතයින් - පාසල් සෞඛ්‍ය සමාජයන්හි සභාපති/සම ලේකම්වරු හා භාණ්ඩාගාරික /ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ සෞඛ්‍ය හා පෝෂණය භාර අමාත්‍යවරයා

දෙමාපිය නියෝජිතවරු (උපරිමය පස් දෙනෙකි.)

මහජන සෞඛ්‍ය පරීක්ෂක

බාහිර සුභපතන්නන්

4.2.2. වගකීම

- පාසලේ සෞඛ්‍ය ප්‍රවර්ධන ශිෂ්‍ය සමාජවල ක්‍රියාකාරකම් සඳහා මගපෙන්වීම වැඩසටහන් නියාමනය කිරීම හා ප්‍රතිපෝෂණය කිරීම.
- ත්‍රෛමාසික රැස්වීම් පවත්වා පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා යොමු කිරීම
- ක්‍රියාකාරී ප්‍රජා සහභාගීත්වය සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන්වලට ලබා ගැනීම.

4.3 කලාප සෞඛ්‍ය ප්‍රවර්ධන කමිටුව

4.3.1 සංයුතිය

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ( සභාපති)
කලාපයේ සෞඛ්‍ය වැඩසටහන් භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
කලාපයේ පෝෂණ වැඩසටහන් භාර නියෝජ්‍ය /සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
කලාප ප්‍රාථමික විෂය භාර නියෝජ්‍ය / සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
කලාපයේ විශේෂ අධ්‍යාපනය භාර නියෝජ්‍ය/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
කලාපයේ උපදේශනය විෂය භාර නියෝජ්‍ය/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
කලාපයේ ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපනය විෂය භාර නියෝජ්‍ය/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
දිස්ත්‍රික් ප්‍රජා වෛද්‍ය විශේෂඥ ( මාතෘ හා ළමා සෞඛ්‍ය)
මාතෘ හා ළමා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් 01
සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී (මානසික සෞඛ්‍ය) 01
සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් ( කලාපයට අයත් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලවල)
කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
ප්‍රාදේශීය පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක
සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරී

4.3.2 වගකීම

- ත්‍රෛමාසික ව කලාප මට්ටමේ රැස්වීම් පවත්වා පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධනයට අදාළ ක්‍රියාකාරකම් ඇගයීම සහ නියාමනය.
- පාසල් වැඩසටහන් සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපෝෂණය ලබා දීම.
- අවශ්‍ය සහය සේවා ලබා දීමට පියවර ගැනීම.
- ඇගයීමේදී රන්,රිදී හා ලෝකඩ සම්මාන සහතික ලබා ගන්නා පාසල් ලේඛණ පළාත් කමිටුවට හා අධ්‍යාපන අමාත්‍යාංශයට ලබා දීම.

4.4 පළාත් සෞඛ්‍ය ප්‍රවර්ධන කමිටුව

4.4.1 සංයුතිය

පළාත් අධ්‍යාපන ලේකම්(සභාපති)
පළාත් සෞඛ්‍ය ලේකම්
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්
පළාත්/ දිස්ත්‍රික් ප්‍රජා වෛද්‍ය විශේෂඥ ( මාතෘ හා ළමා සෞඛ්‍ය)
පළාත් සෞඛ්‍ය වැඩසටහන් භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ
පළාත් පෝෂණ වැඩසටහන් භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ
පළාත් සැලසුම් නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ
පළාත් ප්‍රාථමික නියෝජ්‍යඅධ්‍යාපන අධ්‍යක්ෂ
පළාත් විශේෂ අධ්‍යාපන නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ
පළාත් උපදේශන වැඩසටහන භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ

පළාත් ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපනය භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ ගණකාධිකාරී (පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව)

4.4.2. වගකීම

- ජාතික ප්‍රතිපත්තිය අනුව පළාත් මට්ටමේ සෞඛ්‍ය ප්‍රවර්ධන ප්‍රතිපත්ති තීරණය කිරීම.
- වර්ෂයකට දෙවරක් රැස්වීම් පවත්වා පළාත් මට්ටමේ පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධනයට අදාළ ක්‍රියාකාරකම් ඇගයීම හා නියාමනය.
- රැස්වීම් වාර්තා ජාතික මට්ටමේ කමිටුවට යැවීම.
-පාසල් වැඩසටහන් සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපෝෂණය ලබා දීම.

4.5 ජාතික මට්ටමේ සෞඛ්‍ය ප්‍රවර්ධන මෙහෙයුම් කමිටුව

4.5.1 සංයුතිය

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන නිලධාරීන් දෙදෙනෙකු
ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන නිලධාරියෙකු
අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන)
අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (ප්‍රතිපත්ති සැලසුම් හා කාර්යසාධන සමාලෝචන)
අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී
පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ අධ්‍යක්ෂ
සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේ අධ්‍යක්ෂ
මානසික සෞඛ්‍ය ඒකකයේ අධ්‍යක්ෂ
බෝ නොවන රෝග ඒකකයේ අධ්‍යක්ෂ
අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞඛ්‍ය හා පෝෂණ වැඩසටහන් භාර අධ්‍යාපන අධ්‍යක්ෂ
අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රාථමික අධ්‍යාපන අධ්‍යක්ෂ
අධ්‍යාපන අමාත්‍යාංශයේ නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන අධ්‍යක්ෂ
අධ්‍යාපන අමාත්‍යාංශයේ ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපන අධ්‍යක්ෂ
අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂය සමගාමී මාර්ගෝපදේශ හා උපදේශන අධ්‍යක්ෂ
පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ පාසල් සෞඛ්‍ය වැඩසටහන් භාර විශේෂඥ වෛද්‍ය

4.5.2 වගකීම

- ජාතික මට්ටමේ පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන ප්‍රතිපත්ති තීරණය කිරීම
- වර්ෂයකට දෙවරක් රැස්වීම් පවත්වා පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධනයට අදාළ ක්‍රියාකාරකම් ඇගයීම හා නියාමනය
-පාසල් වැඩසටහන් සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපෝෂණය ලබා දීම

කමිටු ස්ථාපිත කිරීම, නිසි චකවානුවල කමිටු රැස්වීම පැවැත්වීම, සෑම කමිටුවකම සභාපතිවරුන් සතු වගකීම වේ.

5.0 ඇගයීම

පාසල තුළ සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා අවධානය යොමු කළ යුතු අරමුණු හා මූලිකාංග ආශ්‍රයෙන් ඒ ඒ පාසල්වල ක්‍රියාත්මකවන සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් ඇගයීමකට ( ඇමුණුම 1 ඇගයීම් පත්‍රිකාව) ලක් කොට අපේක්ෂිත මට්ටමට පැමිණ ඇති පාසල් හඳුනාගෙන ඒවා අගය කිරීම සඳහා ඇගයීම් සහතිකයක් වාර්ෂිකව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් විසින් නිකුත් කළ යුතුය.

5.1 කලාප මට්ටමේ ඇගයීම් මණ්ඩලය

කලාප මට්ටමේ ඇගයීම් මණ්ඩලය සඳහා කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ ඔහුගේ නියෝජිතයෙකු, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හෝ ඔහුගේ නියෝජිතයෙකු ඇතුළත්වන පරිදි කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නම් කරනු ලබන නිලධාරීන් 4 දෙනෙකුගෙන් සමන්විත විය යුතු ය. ඇගයීම් පත්‍රිකාවට අනුව වැඩි ලකුණු ලබා ගන්නා පාසල් සඳහා කලාප මට්ටමින් පහත සඳහන් පරිදි සහතික ප්‍රදානය කළ යුතු ය.

ලකුණු 100- 80 අතර රන් සම්මානය

ලකුණු 79 – 70 අතර රිදී සම්මානය

ලකුණු 69 – 60 අතර ලෝකඩ සම්මානය

ලකුණු 80 න් ඉහල ගන්නා පාසල් පිළිබඳ තොරතුරු අධ්‍යාපන අමාත්‍යාංශයට ලබා දිය යුතු අතර එම පාසල් ජාතික මට්ටමින් ඇගයීමක් සඳහා ඇතුළත් කරගනු ලැබේ.

5.2 ජාතික ඇගයීම් මණ්ඩලය

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන නිලධාරියෙකු, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන නිලධාරියෙකු, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නම් කරනු ලබන නිලධාරියෙකු, පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් නම් කරනු ලබන නිලධාරියෙකුගෙන් සමන්විත වේ. ලකුණු 80ට වැඩියෙන් ලබා ගන්නා පාසල් සඳහා ජාතික මට්ටමේ පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන ඇගයීම් සහතිකයක් නිකුත් කෙරේ.

(පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහයෝගය ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයාගෙන් ලබාගත හැකි අතර, ඉහත උපදෙස් අනුව වැඩසටහන සාර්ථකව පවත්වාගෙන යාමට අවශ්‍ය සහයෝගය ලබා දීම සියලු ම පළාත් හා කලාප නිලධාරීන්,විදුහල්පතිවරුන්, ගුරුවරුන් හා කාර්ය මණ්ඩලයේ වගකීම වේ.)

මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය මග පෙන්වීම "පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන" උපදෙස් සංග්‍රහ තුළ ඇතුළත්වන අතර එයට අනුකූලව ක්‍රියා කිරීමට සියලු ම විදුහල්පතිවරුන් හා නිලධාරීන් කටයුතු කළ යුතු බව කාරුණිකව දන්වමි.

පද්මසිරි ජයමාන්න
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්

ලේකම්, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය — කරු. අ.ක.ස.